**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල - 2022**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංචාරක සංවර්ධන අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනටමූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංචාරක සංවර්ධන අරමුදලේමූල්‍යප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදන**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංචාරක සංවර්ධන අරමුදල යටතේ පවත්වාගෙන යනු ලබන මුදල් පොතට අනුව රු. 575,721,381 ක් වූ බැංකු අයිරාව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01ට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ වලින් අඩු කර තිබුණි. | අදහස් ලබා දී නොතිබුණි. | බැංකු අයිරාව මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වෙනම පෙන්විය යුතුය. |

**1.5.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා**

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන වලට අනුව ශේෂය | අදාළ වාර්තාවට අනුව ශේෂය | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු . | රු . | රු . | | |
| (අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු පරිපාලන ගාස්තු | 7,041,214 | 74,142 | 6,967,072 | අදහස් ලබා දී නොතිබුණි | ශේෂයන් වරින් වර සැසඳිය යුතු අතර වෙනස්කම් මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල | 222,393,766 | 150,204,306 | 72,189,460 | එකඟ වේ. අසනීප නිවාඩු ලබා සිටින නිලධාරියා වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු වෙන් නොකිරීම නිසා නිරවුල් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. ගිණුම් අවසන් කිරීමට එය බලපෑ අතර මෙම වෙනස්කම් ඇති විය. | ශේෂයන් වරින් වර සැසඳිය යුතු අතර වෙනස්කම් මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට ගෙවිය යුතු මුදල | 1,111,968,89 | 751,021,532 | 360,947,297 | එකඟ විය. අසනීප නිවාඩු ලබා සිටින නිලධාරියා වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු වෙන් නොකිරීම නිසා නිරවුල් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. ගිණුම් අවසන් කිරීමට එය බලපෑ අතර මෙම වෙනස්කම් ඇති විය. | ශේෂයන් වරින් වර සැසඳිය යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට ගෙවිය යුතු මුදල | 190,623,228 | 128,746,548 | 61,876,680 | එකඟ විය. අසනීප නිවාඩු ලබා සිටින නිලධාරියා වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු වෙන් නොකිරීම නිසා නිරවුල් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. ගිණුම් අවසන් කිරීමට එය බලපෑ අතර මෙම වෙනස්කම් ඇති විය. | ශේෂයන් වරින් වර සැසඳිය යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයට ගෙවිය යුතු මුදල | 114,911,748 | 94,286,188 | 20,625,560 | එකඟ විය. අසනීප නිවාඩු ලබා සිටින නිලධාරියා වෙනුවෙන් කිසිදු නිලධාරියෙකු වෙන් නොකිරීම නිසා නිරවුල් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. ගිණුම් අවසන් කිරීමට එය බලපෑ අතර මෙම වෙනස්කම් ඇති විය. | ශේෂයන් වරින් වර සැසඳිය යුතු අතර වෙනස්කම් මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක පනත<br>(i) 24(3) වගන්තිය | වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි. එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පරිපාලන වියදම් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.7,201,468 ක් ගෙවා තිබුණි. | එකඟ වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පරිපාලන වියදම් අය කර ඇත. | සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය සහ පරිපාලනය සඳහා නීති රීති සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 24 (8) සහ (9) වගන්ති | අරමුදලට ලැබෙන සියලුම මුදල් ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ ඒ ආශ්‍රිත අලෙවිකරණ කටයුතු සඳහා යෙදවීම යන අරමුණට පටහැනිව රු.1,250,000,000 ක මුදලක් මාසයක කල්පිරීමේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | ලැබෙන අරමුදල් නිරවුල් කිරීම සඳහා කාලය ගතවන බැවින්, එකතු කරන ලද බදුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් ප්‍රධාන ගිණුම්වල සාධාරණ කාලයක් අක්‍රියව පවතී. අරමුදල බෙදා හැරෙන තෙක් ආයෝජනය කර පොලී උපයා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ආයතන හතර අතරේ ඉපයූ මුළු පොලී ආදායම වූ රු.26,712,329ක් ද බෙදා හරින ලදී. | අරමුදලට ලැබෙන තැන්පතු ප්‍රධාන වශයෙන් ආයතන 04ට සහ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට අවශ්‍ය බැවින් කාලෝචිත ලෙස නිරවුල් කිරීම සිදු කළ යුතුය. |
| (ආ) 2018 අංක 35 දරන මුදල් පනතේ I කොටසෙහි (3) වගන්තිය | 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ බලපත්‍රය ලබාගෙන ඇති සියයට 0.5ක බද්දක් අයකරන ආයතනවලින් එම බද්ද අය කළ දින සිට දින 30ක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු වුවද, 2022 දී අය කරන ලද බදු මුදල වූ රු.14,114,147 ක් , දින 53 සිට දින 150 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි. | අරමුදලේ බැංකු ගිණුම්වලට බැර කරන ලද මුළු ලැබීම් අතරින්, 0.5% සඳහා ගෙවන ලද ගෙවීම් අනෙකුත් ලැබීම් වලින් වෙන් කිරීමට අවශ්‍ය වන අතර තවත් බොහෝ තැන්පතු බැර වී ඇති බැවින් බැංකු ගිණුම් සංසන්දනය කර සෑම ලැබීමක්ම පරීක්ෂා කිරීමෙන් පසු එය හඳුනාගත හැකිය. මෙම ක්‍රියාවලියට සාමාන්‍ය පරිදි කාලයක් ගතවේ. කෙසේ වෙතත්, 2022 වර්ෂයේදී, විෂය භාර නිලධාරියා අසනීප නිවාඩු ලබා සිටි බැවින් එකතු කරන ලද බදු පරීක්ෂා කිරීමට සහ හඳුනා ගැනීමට වෙනදාට වඩා වැඩි කාලයක් ගත විය. එබැවින්, එකතු කරන ලද 0.5% සංචාරක සංවර්ධන බද්ද එකතු කළ දින සිට දින 30ක් ඇතුළත භාණ්ඩාගාරයට යැවීමට නොහැකි විය. | සංචාරක සංවර්ධන බද්දේ භාණ්ඩාගාරයට අදාල කොටස නියමිත වේලාවට ප්‍රේෂණය කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසාය (SOE) සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මානව සම්පත්වල නුසුදුසු කළමනාකරණය හේතුවෙන් .සමාලෝචිත වර්ෂය සඳහා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 10 වැනි දින දින 70 ක ප්‍රමාදයක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | අදහස් ලබා දී නොතිබුණි.. | මුදල් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ආදායම රු.4,082,016,673ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු. 1,313,694,142 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායමෙහි රු. 2,768,322,531ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි සංචාරක සංවර්ධන බදු රු. 616,120,939 කින් වැඩිවීම සහ අපගමන බදු ආදායම රු. 2,113,882,345 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.116,567,818 ක මුදලක් බැංකුවට සෘජුවම ප්‍රේෂණය කර තිබුණද, එය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට ජංගම වගකීම් යටතේ අඛණ්ඩව ඉදිරියට ගෙනවිත් තිබුණි. | එකඟ නොවේ , මෙය අඛණ්ඩ ශේෂයක් නොවේ. රට තුළ පවතින වසංගත තත්ත්වය සහ ගමන් සීමා කිරීම් හේතුවෙන් සංචාරක සංවර්ධන අධිකාරිය වෙත නොපැමිණ මුදල් ගෙවීමේ නව ක්‍රමවේදයක් අප හඳුන්වා දී තිබේ. කෙසේ වෙතත්, බදු ගෙවන අයගෙන් සමහරක් මාර්ගගත ක්‍රමය භාවිතා කර මුදල් තැන්පතු යන්ත්‍ර භාවිතා කර යොමු කිරීම් පිළිබඳ විස්තර සඳහන් නොකර ගෙවීම් කර ඇත. 2020 සහ 2021 වසර තුළ මෙම අපැහැදිලි මුදල ක්‍රමයෙන් වැඩි වීමට හේතුව එය වේ. හඳුනා නොගත් බදු මුදලේ ශුද්ධ මුදල රු.116,567,818 අවසාන ගිණුමේ පෙන්වා ඇති අතර එය තවමත් ගෙවන්නාගේ විස්තර නොමැති වීම හේතුවෙන් සංචාරක සංවර්ධන බද්ද ලෙස හඳුනා ගැනීමට නොහැකි වී ඇත. ගෙවන්නන් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී . | බදු ගෙවන්නන් හඳුනාගෙන නියමිත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය . |